// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2241/36 - 2021 අගෝස්තු මස 18 වැනි බදාදා - 2021.08.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 51/53 (III)

### (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත

(437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රමේෂ් පතිරණ,
වැවිලි අමාත්‍ය.

2021 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2021 අංක 01 දරන රබර් (නැවත වගා කිරීමේ) සහනාධාර නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙම නියෝග 2019 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

2. (436 වන අධිකාරය ) වූ රබර් පාලන පනතේ 7 වන වගන්තිය යටතේ රබර් නැවත වගා කිරීම සඳහා අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති (මෙහි මින්මතු "අවසරපත්‍ර දරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් රබර් වත්තක හෝ කුඩා රබර් ඉඩමක හිමිකරුවකු විසින් එම රබර් වත්තේ හෝ කුඩා රබර් ඉඩමේ රබර් පැළ නැවත වගා කිරීමේ කාර්යය සඳහා සහනාධාරයක් ලබාගැනීමට රබර් පාලකවරයා වෙත ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

3. 2 වන නියෝගය යටතේ සහනාධාරයක් සඳහා වන සෑම ඉල්ලීමක් ම, රබර් පාලකවරයා විසින් නිර්ණය කරනු ලැබිය හැකි ආකෘතියකට අනුකූලව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

1A - PG 5531 — 440 (2021/08)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

4. එම ඉල්ලීම ලැබීමෙන් පසුව, රබර් පාලකවරයා විසින් මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලින් එම ඉල්ලුම්කරුට සහනාධාරයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

5. 2019 වර්ෂය හෝ ඉන්පසුව එළඹෙන වර්ෂයක් සම්බන්ධයෙන්, අනන්‍ය පෞද්ගලික හිමිකාරිත්වයක් ඇති රබර් වත්තක හෝ කුඩා රබර් ඉඩමක යම් නිශ්චිතව සඳහන් කරන ලද කොටසක නැවත රබර් වගාකිරීම සඳහා ගෙවිය යුතු සහනාධාර මුදල එම බිම් ප්‍රදේශයේ එක් එක් හෙක්ටයාරය සඳහා රුපියල් තුන්ලක්ෂ පනස් දහසක් (රු.350,000) විය යුතු අතර එය පහත දැක්වෙන ආකාරයේ වාරික අවකින් ගෙවනු ලැබිය යුතු ය:-

(අ) (i) නැවත වගාකරනු ලැබිය යුතු භූමි ප්‍රදේශයේ තිබෙන රබර් ගස් සහ අනෙකුත් වෘක්ෂලතාදිය උදුරා දැමීමෙන් පසුව එම භූමි ප්‍රදේශයේ එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් දහසය දහසක් (රු.16,000) වන පළමු වන වාරිකය, ගෙවනු ලැබිය යුතු ය;

(ii) එම ඉඩමේ තිබෙන රබර් ගස් හා අනෙකුත් වෘක්ෂලතාදිය සම්පූර්ණයෙන් ම උදුරා දැමීම සම්පූර්ණ කළ බවට දැනුම් දීමෙන් පසුව, රබර් පාලකවරයා විසින්, පළමුවන වාරිකයෙන් සියයට පනහක් (50%) නොඉක්මවන මුදලක් එම රබර් වත්තේ හෝ කුඩා රබර් ඉඩමේ අවසරපත්‍ර දරන්නා වෙත කොටස් ගෙවීමක් ලෙස ගෙවනු ලැබිය හැකි ය;

(iii) රබර් නැවත වගා කිරීම සඳහා වලවල් හෑරීම අවසන් වූ පසුව රබර් පාලකවරයා විසින්, අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී යම් අමතර මුදලක් ගෙවීම සඳහා අවසර දෙනු ලැබිය හැකිය;

(ආ) (i) එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් අසූහය දහසක (රු.86,000) දෙවන වාරිකය, නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව ගෙවනු ලැබිය යුතු ය;

(ii) නැවත වගා කිරීම සම්පූර්ණ කළ බවට දැනුම් දීමෙන් පසුව, රබර් පාලකවරයා විසින්, දෙවන වාරිකයෙන් සියයට පනහක් (50%) නොඉක්මවන මුදලක් අවසර පත්‍ර දරන්නා වෙත කොටස් ගෙවීමක් ලෙස ගෙවනු ලැබිය හැකි ය.

(iii) දෙවන වාරිකය ගෙවීම සඳහා අවශ්‍ය සියලු කටයුතු සිදු කර නොමැති බවට පරීක්ෂණයේ දී පෙනීයන විට දී, පහත දැක්වෙන කටයුතු පහත දැක්වෙන ආකාරයට අනුව සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව ගෙවීම සිදු කරනු ලැබිය යුතු ය:-

| සම්පූර්ණ කළ යුතු කටයුතු | හෙක්ටයාරයක් සඳහා වන සහනාධාරය රු. ශත |
|---|---|
| 1. වලවල් හෑරීම සහ බද්ධ පැළ සිටුවීම | 50,000.00 |
| 2. පාංශු සංරක්ෂණය (කානු කැපීම හෝ ගල් වැටි හෝ වේදිකා ඉදිකිරීම හෝ ආවරණ ශාක වගා කිරීම යනාදිය) | 20,000.00 |
| 3. වැට බැඳීම | 16,000.00 |

(iv) ගෙවීමට ඇති යම් ඉතිරි මුදල් ප්‍රමාණයක් වේ නම්, සම්පූර්ණ නොකළ කටයුතු සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් ගෙවනු ලැබිය යුතු ය ;

(v) සිදු කිරීමට අවශ්‍ය එම කටයුතු සම්පූර්ණ කරන තෙක් පසු වාරික ගෙවීම අත්හිටුවනු ලැබිය යුතු ය ;

(vi) මෙම සහනාධාරයට අමතරව, රබර් පාලකවරයා විසින් රබර් පැළ සමඟ නිර්දේශිත ආවරණ බෝග වගා කිරීම සඳහා අමතර ගෙවීමක් සිදු කිරීමට අවසර දෙනු ලැබිය හැකි ය.

(ඇ) එක් එක් හෙක්ටයාරය සඳහා රුපියල් තිස් දහසක (රු.30,000) තුන් වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසරකට නොඅඩු කාලයකට පසු ගෙවනු ලැබිය යුතු ය ;

(ඈ) එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් හතළිස් දෙදහසක (රු.42,000) හතර වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර දෙකකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසුව ගෙවනු ලැබිය යුතු ය.

(ඉ) එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් හතළිස් දෙදහසක (රු.42,000) පස්වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර තුනකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය.

(ඊ) එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් හතළිස් දෙදහසක (රු.42,000) හයවන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර හතරකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය.

(උ) එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් හතළිස් හතර දහසක (රු.44,000) හත්වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර පහකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය.

(ඌ) එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් හතළිස් අට දහසක (රු.48,000) අටවන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර හයකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය.

6. 5 වන නියෝගයේ (අ) සිට (ඌ) දක්වා වන ඡේදවල නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රගතිය, එහි නිශ්චිතව සඳහන් කාලසීමාවන්ට පෙරාතුව ළඟාකරගෙන ඇති බවට රබර් පාලකවරයා විසින් සෑහීමට පත්වන විට දී, ඔහු විසින් ස්වකීය අභිමතය පරිදි අදාළ වාරිකය ඊට පෙර දිනයක දී නිදහස් කරනු ලැබිය හැකි ය.

7. 17 වන නියෝගයේ (අ) සහ (ආ) වන ඡේදවලට අනුකූලව මීස නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර හතක් ඉක්මවීමෙන් පසු හෝ එම වගාවේ කිරි කැපීම ආරම්භ කිරීමෙන් පසු කිසිම සහනාධාර වාරිකයක් ගෙවනු නොලැබිය යුතු ය.

8. වගා කිරීමෙහි ගස් සිටුවන ලද දිනය නැවත රබර් වගා කරන ලද දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.

9. නැවත වගා කරනු ලැබිය යුතු භූමි ප්‍රදේශය ප්‍රමාණයෙන් හෙක්ටයාරයකට අඩුවන විට දී හෝ එම භූමි ප්‍රදේශයට හෙක්ටයාරයකට අඩු කොටසක් ඇතුළත් වන විට දී, ගෙවිය යුතු සහනාධාර මුදල ගණනය කිරීමේ දී එම භූමි ප්‍රමාණය හෝ එම භූමි කොටස හෙක්ටයාරයකට දරන්නා වූ අනුපාතයට අනුව, එම භූමි ප්‍රමාණය හෝ කොටසම සඳහා මේ නියෝගවල 5 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද මුදල් ප්‍රමාණ ගෙවනු ලැබිය යුතු ය.

10. රබර් වතුවල හෝ කුඩා රබර් වතුවල නැවත රබර් වගා කිරීමෙන් පසු පස්වන වසර අවසානයේ දී හෙක්ටයාරයකට තිබිය යුතු ගස් ප්‍රමාණයෙන් අවම වශයෙන් 2/3 ක ප්‍රමාණයක්, පොළොවේ සිට මැනීමේ දී සෙන්ටිමීටර් එකසිය විසි එකයි දශම නවයයි දෙකක් (121.92) ඉහළින් සෑදෙන පරිධිය සෙන්ටිමීටර් පනහයි දශම අටයි බින්දුවක (50.80) වට ප්‍රමාණයක් දරන බවට රබර් පාලකවරයා විසින් තත් කාර්ය සඳහා ලියවිල්ලක් මගින් බලය දෙන ලද නිලධරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක් ලැබුණු පසුව, එම රබර් වතු හෝ කුඩා රබර් ඉඩම් නැවත වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් දාහතර දහසක (රු.14,000) මුදලකින් යුත් දිරිගැන්වීමේ දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

11. අවසරපත්‍ර දරන්නකු විසින්, සහනාධාර වාරික භාර ගැනීම සහ සහනාධාර ගෙවීම් වාරික ආපසු අයකර ගැනීම් බලාත්මක කිරීම පිණිස යම් රාජ්‍ය බැංකුවක හෝ පෞද්ගලික වාණිජ බැංකුවක ශාඛාවක ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යා යුතු ය.

12. 19 වන නියෝගය යටතේ රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නිකුත් කරනු ලබන විධාන සහ නියමවලට අනුකූලව කටයුතු කිරීම සහ නැවත වගා කරන ලද භූමි ප්‍රදේශය හොඳ කෘෂිකාර්මික තත්ත්වයකින් පවත්වාගෙන යාම 5 වන නියෝගය යටතේ සහනාධාරයේ පළමුවන වාරිකය ගෙවනු ලැබ ඇති සෑම අවසරපත්‍ර දරන්නකුගේ ම කාර්යය විය යුත්තේ ය.

13. නැවත වගා කිරීමේ අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති භූමි ප්‍රදේශයක් සම්බන්ධයෙන් 5 වන නියෝගය යටතේ එක් සහනාධාර වාරිකයක් හෝ ඊට වැඩි සහනාධාර වාරික සංඛ්‍යාවක් ගෙවීමට ඉතිරිව ඇති යම් අවසරපත්‍ර දරන්නකු විසින්, රබර් පාලකවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව එම මුළු බිම් ප්‍රදේශයම හෝ එම භූමි ප්‍රදේශයෙන් කොටසක් විකිණීම හෝ අන්සතුකරණයකින් බැහැර කිරීම සිදු කරනු නොලැබිය යුතු ය.

14. 5 වන නියෝගය යටතේ පළමුවන වාර්ිකය ගෙවනු ලැබ ඇත්තේ යම් අවසරපත්‍ර දරන්නකුට ද එම අවසරපත්‍ර දරන්නා විසින් වසරක් ඇතුළත හෝ රබර් පාලකවරයා විසින් දෙනු ලැබිය හැකි තවදුරටත් වූ කාලයක් ඇතුළත වගා කරනු ලැබිය යුතු භූමි ප්‍රදේශයේ තිබෙන වෘක්ෂලතාදිය උදුරා දමා එම භූමි ප්‍රදේශය එළිපෙහෙළි කොට -

(අ) රබර් පාලකවරයා විසින් අනුමත කරන ලද යම් වර්ගයකට හෝ වර්ගවලට අයත් රබර් පැළවලින් එම භූමි ප්‍රදේශය නැවත වගා කිරීම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය;

(ආ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මඟින් එසේ කරන ලෙස නියම කර ඇති විට දී රබර් පැළ සහ භූමි ආවරණ රනිල පැළ හැර අනෙකුත් සියලු පැළ එම භූමි ප්‍රදේශයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය;

(ඇ) ලිඛිත දැන්වීමක් මඟින් රබර් පාලකවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි කාණු හෝ ගල් වැටි හෝ එම භූමි ප්‍රදේශයේ ඉදිකරනු ලැබිය යුතු ය;

(ඈ) එම භූමි ප්‍රදේශයේ භූමි ආවරණ රනිල පැළ සිටුවීම හෝ ලිඛිත දැන්වීමක් මඟින් රබර් පාලකවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි එම භූමි ප්‍රදේශයේ පාංශු ඛාදනය වැළැක්වීම සඳහා අවශ්‍ය වෙනත් යම් පියවර ගැනීම සිදු කරනු ලැබිය යුතු ය; සහ

(ඉ) ලිඛිත දැන්වීමක් මඟින් රබර් පාලකවරයා විසින් එසේ කරන ලෙස ඉල්ලා ඇත්නම්, එම භූමි ප්‍රදේශය වටා වැටක් ඉදිකරනු ලැබිය යුතු ය.

15. (1) අවසරපත්‍ර දරන්නා විසින් 14 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද යම් කාර්යයක් සිදු කර නොමැති විට දී, රබර් පාලකවරයා විසින්, එම කාර්යය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන පරිදි මිනිසුන් සේවයේ නියුක්ත කරවීම සහ අවශ්‍ය ද්‍රව්‍ය යෙදීම කරනු ලැබිය හැකිය.

(2) රබර් පාලකවරයා විසින්, ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම්, එම අවසරපත්‍ර දරන්නාට ගෙවිය යුතු සහනාධාරවලින් අඩු කරනු ලැබිය යුතු ය.

16. යම් භූමි ප්‍රමාණයක් සම්බන්ධයෙන් සහනාධාරයක් හෝ ඉන් කොටසක් ගෙවනු ලැබ ඇති යම් සෑම අවසරපත්‍ර දරන්නකු විසින්ම එම භූමි ප්‍රදේශයේ එක් එක් හෙක්ටයාරය තුළ නැවත වගා කරන ලද අවම රබර් පැළ සංඛ්‍යාව පහත දැක්වෙන නියමයන්ට අනුකූල වන බවට වගබලා ගත යුතු ය:-

(අ) (i) වගා කර ඇත්තේ (මෙහි මින්මතු "ශ්‍රී.ල.ර.ප.ආ.") යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ (මෙහි මින්මතු "ආර්.ආර්.අයි.සී., ආර්.ආර්.අයි.එස්.එල්.") යනුවෙන් සඳහන් කරනු ලබන රබර් ක්ලෝන සහ රබර් පාලකවරයා විසින් අනුමත කරන ලද වෙනත් වැඩි ඵලදාවක් ලබාදෙන බද්ධ පැළ නම්, නැවත වගා කරන අවස්ථාවේ දී හෙක්ටයාරයකට පැළ 516 වන පරිදි;

(ii) නැවත වගා කිරීමෙන් පසුව පළමුවන වසර සහ දෙවන වසර අවසානයේ දී හෙක්ටයාරයකට පැළ 516 ක් වන පරිදි;

(iii) වගා කිරීමෙන් පසු තුන්වන සහ හතර වන වසර අවසානයේ දී හෙක්ටයාරයකට පැළ 475 ක් වන පරිදි;

(iv) නැවත වගා කිරීමෙන් පසු ඊළඟ අනුගාමී වසර දෙක සඳහා හෙක්ටයාරයකට පැළ 450 ක් වන පරිදි;

(v) 17 වන නියෝගයේ (ආ) ඡේදයට අනුව, නැවත වගා කිරීමෙන් පසු ඊළඟ අනුගාමී වසර තුන සඳහා හෙක්ටයාරයකට පැළ 450 ක් වන පරිදි.

(ආ) බද්ධ කරන ලද රබර් පැළ පහත දැක්වෙන පරිදි වන දුර ප්‍රමාණවලින් සහ නිශ්චිතව සඳහන් කරන ලද පැළ සංඛ්‍යාවෙන් යුතුව සිටුවනු ලැබිය යුතු ය:-

(i) ආර්.ආර්.අයි.සී, ආර්.ආර්.අයි.එස්.එල්. ක්ලෝන සහ වෙනත් වැඩි ඵලදාවක් ලබාදෙන ක්ලෝන සඳහා-

| පැළ අතර පරතරය | පැළ සංඛ්‍යාව |
|---|---|
| සෙ.මී 350 x සෙ.මී.550 (11' x" 18') | හෙක්ටයාරයකට 516 (අක්කරයකට 209) |
| සෙ.මී 430 x සෙ.මී.450 (14' x 14'9") | හෙක්ටයාරයකට 516 (අක්කරයකට 209) |

(ii) ආර්.ආර්.අයි.සී, ආර්.ආර්.අයි.එස්.එල්. ක්ලෝන සහ වෙනත් වැඩි ඵලදාවක් ලබාදෙන ක්ලෝන සමග අතුරු භෝග වගා කිරීම සඳහා-

| පැළ අතර පරතරය | පැළ සංඛ්‍යාව |
|---|---|
| සෙ.මී 250 x සෙ.මී.775 (8' x 26') | හෙක්ටයාරයකට 516 (අක්කරයකට 209) |

(ඇ) රබර් පාලකවරයා විසින් ඉහත සඳහන් දුර ප්‍රමාණයන් හැර වෙනත් විවිධ දුර ප්‍රමාණයන් හි පැළ සිටුවීම සඳහා භූමියේ පිහිටීම සලකා බලා අවසර දෙනු ලැබිය හැකි ය.

එසේ වුව ද, පැළ අතර අවම දුර ප්‍රමාණය මේ නියෝගයේ (ආ) ඡේදයේ (i) වන සහ (ii) වන අනුඡේදවල සඳහන් කරන ලද සංඛ්‍යාවලට අනුකූල විය යුතු ය.

*17. යම් භූමි ප්‍රදේශයක නැවත වගා කරන ලද රබර් පැළ පොළවට ඉහළින් සෙන්ටිමීටර් 121.92ක උසකදී රබර් පැළයේ අවම වට ප්‍රමාණය පහත පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නා වූ පියවර ගැනීම, එම භූමි ප්‍රදේශය සම්බන්ධයෙන් සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් ගෙවන ලද්දේ යම් අවසරපත්‍ර දරන්නකු වෙත ද එවැනි සෑම අවසරපත්‍ර දරන්නකුගේ ම කාර්යය විය යුත්තේ ය.

(අ) සෙන්ටිමීටර 254ක සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් සහිත දිස්ත්‍රික්කයක එම භූමි ප්‍රදේශය පිහිටා ඇති අවස්ථාවක දී සහ පහත I වන වගුවේ නියමිතව සඳහන් කරන ලද පරිදි විය යුතු ය :-

I වැනි වගුව

| වගාවේ වයස | සඳහන් වට ප්‍රමාණය (සෙන්ටිමීටර්) |
|---|---|
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වසර අවසානයේ දී | 10.16 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වසර අවසානයේ දී | 15.87 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හතර වන වසර අවසානයේ දී | 25.40 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වසර අවසානයේ දී | 31.75 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හත්වන වසර අවසානවීමට පෙර | 50.80 |

(ආ) සෙන්ටිමීටර 254කට වඩා අඩු සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් සහිත දිස්ත්‍රික්කයක එම භූමි ප්‍රදේශය පිහිටා ඇති අවස්ථාවක දී පහත II වන වැනි වගුවේ නියමිතව දක්වා ඇති පරිදි විය යුතු ය :-

II වැනි වගුව

| වගාවේ වයස | සඳහන් වට ප්‍රමාණය (සෙන්ටිමීටර්) |
|---|---|
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වසර අවසානයේ දී | 10.16 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වසර අවසානයේ දී | 13.97 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වසර අවසානයේ දී | 22.86 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වසර අවසානයේ දී | 27.94 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන අටවන වසර අවසානවීමට පෙර | 50.80 |

18. යම් භූමි ප්‍රමාණයක් සම්බන්ධයෙන් සම්පූර්ණ සහනාධාරයක් හෝ එයින් යම් කොටසක් හෝ ලැබූ කිසිදු අවසරපත්‍ර දරන්නකු විසින්, රබර් පැළවලින් සියයට හැටක් (60%) වත් පොළවේ සිට මනින විට දී උස සෙන්ටිමීටර එකසිය විසි එකයි දශම නවයයි දෙකක් දී (121.92) කඳෙහි අවම වට ප්‍රමාණය සෙන්ටි මීටර පනහයි දශම අටයි බින්දුව (50.80) වන තුරු රබර් ගස්වල කිරි කැපීම හෝ කිරි කැපීමට සැළැස්වීම නොකළ යුතු ය.

19. 5 වැනි නියෝගය යටතේ යම් අවසරපත්‍ර දරන්නකු වෙත සහනාධාරයක් ගෙවීමට ඇති හෝ ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී, රබර් පාලකවරයා විසින් දැන්වීමක් මගින් ලිඛිතව නිශ්චිතව දක්වා ඇති යම් කාල පරිච්ඡේදයක් ඇතුළත, රබර් වත්තක් හෝ කුඩා රබර් ඉඩමක් නැවත වගා කිරීම සතුටුදායක ආකාරයෙන් සිදුකරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යැයි රබර් පාලකවරයා විසින් සළකන යම් විධාන හා නියමයන්ට එකී අවසරපත්‍ර දරන්නා අනුකූල විය යුතු ය.

20. යම් සහනාධාරයක් හෝ සහනාධාරයකින් යම් ප්‍රමාණයක් ගෙවනු ලැබ ඇත්තේ යම් අවසරපත්‍ර දරන්නකු වෙත ද එම අවසර පත්‍ර දරන්නා විසින් 12 වන, 13 වන, 14 වන, 15 වන, 16 වන, 17 වන හෝ 18 වන නියෝගවල විධිවිධාන කඩකර ඇති බව රබර් පාලකවරයාගේ මතය වන අවස්ථාවක දී, යම් භූමි ප්‍රදේශයක් සම්බන්ධයෙන් අවසරපත්‍ර දරන්නා වෙත ගෙවනු ලැබූ සහනාධාර මුදල වහාම හෝ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලය ඇතුළත නැවත ගෙවීමට රබර් පාලකවරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින් ඔහුට නියම කරනු ලැබිය හැකි අතර මේ නියෝගය යටතේ දැන්වීම ඉදිරිපත් කරනු ලැබුවේ යම් අවසරපත්‍ර දරන්නකු වෙත ද එම තැනැත්තා විසින් එම දැන්වීමට අනුකූල වීමට අපොහොසත් නොවිය යුතු ය.

21. (1) යම් අවසරපත්‍ර දරන්නකු විසින් මේ නියෝග යටතේ ගෙවන ලද සහනාධාරය ආපසු ගෙවීමට අපොහොසත් වන කිනැම අවස්ථාවක දී, අධිකරණයක් විසින් පනවනු ලැබූ දඩයක් ලෙස එම මුදල් ප්‍රමාණය ආපසු අයකර ගත යුතු ය.

(2) සහනාධාර වාරික එකක් හෝ ඊට වැඩි ගණනක් ලබාගෙන ඇති යම් තැනැත්තකු විසින්, එම සහනාධාරය ආපසු ගෙවීමට අපොහොසත් වී ඇති බවට සහ රබර් වත්තක් හෝ කුඩා රබර් ඉඩමක් අත්හැර දමූ බවට රබර් පාලකවරයා විසින් නිකුත් කරන ලැබූ සහතිකයක් ඉදිරිපත් කිරීම, ඒ කරුණ පිළිබඳ බැඳූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

22. කලින් කලට සංශෝධිත පරිදි, 1953 සැප්තැම්බර් මස 13 වන දිනැති අංක 10594 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර නියෝගවල විධිවිධානයන්හි කුමක් සඳහන් වුව ද, පිළිවෙලින් 2013, 2014, 2015, 2016, 2017, 2018 සහ 2019 වර්ෂයන්ට අදාළව නිකුත් කරන ලද රබර් නැවත වගා කිරීමේ යම් අවසර පත්‍රයක් වෙනුවෙන් ගෙවිය යුතු පහත සඳහන් සහනාධාර වාරික සහ එම අවසරපත්‍ර වෙනුවෙන් ගෙවිය යුතු සියලුම වාරික මේ නියෝග ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ගෙවා නොමැති අවස්ථාවක දී, එම වාරික, 5 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද අනුප්‍රමාණ අනුව පහත දක්වා ඇති පරිදි ගෙවනු ලැබිය යුතු ය :-

| | |
|---|---|
| 2013 වර්ෂය | - 5 (ඌ) නියෝගයට අනුකූලව අටවන වාරිකය ; |
| 2014 වර්ෂය | - 5 (උ) නියෝගයට අනුකූලව හත්වන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2015 වර්ෂය | - 5 (ඊ) නියෝගයට අනුකූලව හයවන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2016 වර්ෂය | - 5 (ඉ) නියෝගයට අනුකූලව පස්වන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2017 වර්ෂය | - 5 (ඈ) නියෝගයට අනුකූලව හතරවන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2018 වර්ෂය | - 5 (ඇ) නියෝගයට අනුකූලව තුන්වන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2019 වර්ෂය | - 5 (අ) සහ 5 (ආ) නියෝගවලට අනුකූලව පළමුවන සහ දෙවන වාරිකවල සිට ඉදිරියට ; |

23. මේ නියෝගවල :-

"හිමිකරු" යන්නට, (436 වන අධිකාරය වූ) රබර් පාලන පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"වත්ත" යන්නට, (436 වන අධිකාරය වූ) රබර් පාලන පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"නැවත වගා කිරීම" යන්නට, (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"නැවත වගා කිරීමේ අවසර පත්‍රය" යන්නෙන්, (436 වන අධිකාරය වූ) රබර් පාලන පනතේ 7 (1) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අදහස් වේ ;

"රබර් පාලකවරයා" යන්නට, (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

එල්.ඩී.බී. 51/53 (III)

### (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත

(437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රමේෂ් පතිරණ,
වැවිලි අමාත්‍ය.

2021 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2021 අංක 02 දරන (අලුතින් රබර්වගා කිරීමේ) සහනාධාර නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙම නියෝග 2019 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

2. (436 වන අධිකාරය ) වූ රබර් පාලන පනතේ 7 වන වගන්තිය යටතේ අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති (මෙහි මින්මතු "අවසරපත්‍ර දරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) රබර් වත්තක හෝ කුඩා රබර් ඉඩමක හිමිකරු විසින් එම වත්තේ හෝ කුඩා ඉඩමේ පළමු වරට රබර් පැළ වගා කිරීමේ කාර්යය සඳහා සහනාධාරයක් ලබාගැනීමට රබර් පාලකවරයා වෙත ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

3. 2 වන නියෝග යටතේ සහනාධාරයක් සඳහා වන සෑම ඉල්ලීමක් ම, රබර් පාලකවරයා විසින් නිර්ණය කරනු ලැබිය හැකි ආකෘතියකට අනුකූලව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

4. එම ඉල්ලීම ලැබීමෙන් පසුව, රබර් පාලකවරයා විසින් මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලෙන් සහනාධාරයක් ඉල්ලුම්කරු වෙත ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

5. 2019 වර්ෂයේ හෝ ඉන්පසුව එළඹෙන වර්ෂයක් සම්බන්ධයෙන්, අනන්‍ය පෞද්ගලික හිමිකාරීත්වයක් ඇති රබර් වත්තක හෝ කුඩා රබර් ඉඩමක යම් නිශ්චිත කොටසක පළමුවරට රබර් වගාකිරීම සඳහා ගෙවිය යුතු සහනාධාර මුදල අලුතින් රබර් වගා කරනු ලබන එක් එක් හෙක්ටයාරයක භූමි ප්‍රදේශයක් සඳහා රුපියල් ලක්ෂ තුනක් (රු. 300,000) විය යුතු අතර එය පහත දැක්වෙන ආකාරයේ වාරික අටකින් ගෙවනු ලැබිය යුතු ය:-

(අ) (i) අලුතින් වගා කිරීමට අවසර ලබා දී ඇති භූමි ප්‍රදේශයේ ඇති වන්ජලතාදිය මුලින් උදුරා දැමීමෙන් පසු හා රබර් පැළ සිටුවීම සඳහා වළවල් හෑරීමෙන් පසු එසේ අලුතින් වගා කිරීමට අවසර දී ඇති භූමි ප්‍රදේශයේ එක් එක් හෙක්ටයාරයකට රුපියල් දොළොස් දහසක් (රු.12,000) බැගින් වූ පළමු වන වාරිකය, ගෙවනු ලැබිය යුතු ය ;

(ii) වළවල් හෑරීම සම්පූර්ණ කිරීමෙන් පසු එලෙස අවසර ලබාදීමට සුදුසු යැයි රබර් පාලකවරයා සලකනු ලබන අවස්ථාවක දී, යම් අමතර පාරිතෝෂිකයක් ගෙවීම සඳහා රබර් පාලකවරයා අවසර ලබා දිය යුතු ය ;

(ආ) (i) එක් එක් හෙක්ටයාරයකට රුපියල් හැත්තෑ දෙදහසක් (රු. 72,000) බැගින් වූ දෙවන වාරිකය, අලුතින් වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව ගෙවනු ලැබිය යුතු ය.

(ii) අලුතින් වගා කිරීම සම්පූර්ණ කර ඇති බව දැනුම් දීමෙන් පසුව, රබර් පාලකවරයා විසින්, දෙවන වාරිකයෙන් සියයට පනහක් (50%) නොඉක්මවන්නා වූ මුදලක් රබර් වත්තේ හෝ කුඩා රබර් ඉඩමේ අවසර පත්‍ර දරන්නාට කොටස් ගෙවීමක් ලෙස ගෙවනු ලැබිය හැකි ය.

(iii) එම වාරිකය ගෙවීම සඳහා අවශ්‍ය සියලු කටයුතු සම්පූර්ණ කර නොමැති බවට පරීක්ෂණයේ දී සොයා ගනු ලබන අවස්ථාවක, පහත දැක්වෙන කටයුතු පහත දැක්වෙන ආකාරයට සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු එම ගෙවීම කරනු ලැබිය යුතු ය:-

| සම්පූර්ණ කළ යුතු කටයුතු | හෙක්ටයාරයක් සඳහා වන සහනාධාරය රු. ශත |
|---|---|
| 1. වලවල් හෑරීම සහ බද්ධ පැළ සිටුවීම | 40,000.00 |
| 2. පාංශු සංරක්ෂණය (අගල් කැපීම හෝ උස් තලාවන් හි ගල්වැටි සකස් කිරීම හෝ ආවරණ වැල් වගා කිරීම ආදිය) | 16,000.00 |
| 3. වැට බැඳීම | 16,000.00 |

(iv) ගෙවීමට ඇති යම් ඉතිරි මුදල් ප්‍රමාණයක් වේ නම්, සම්පූර්ණ නොකළ වැඩ කටයුතු සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් ගෙවනු ලැබිය යුතු ය.

(v) එකී නියමිත වැඩ කටයුතු සම්පූර්ණ කරන තෙක් පසු වාරික ගෙවීම් අත්හිටුවනු ලැබිය යුතු ය ;

(vi) මෙම සහනාධාරයට අමතරව, රබර් පාලකවරයා විසින් රබර් පැළ සමග නිර්දේශිත අතුරු බෝග වගා කිරීම වෙනුවෙන් අමතර ගෙවීමක් කිරීමට අවසර දෙනු ලැබිය හැකි ය.

(ආ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් විසිහතර දහස (රු. 24,000) බැගින් වූ තුන් වන වාරිකය අලුතින් වගා කිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය.

(ඇ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් තිස්හය දහස (රු. 36,000) බැගින් වූ හතර වන වාරිකය අලුතින් වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය.

(ඈ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් තිස්හය දහස (රු. 36,000) බැගින් වූ පස්වන වාරිකය අලුතින් වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය.

(ඉ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් තිස්හය දහස (රු. 36,000) බැගින් වූ හයවන වාරිකය අලුතින් වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු හතරකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය.

(ඊ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් තිස්අට දහසක (රු. 38,000) බැගින් වූ හත්වන වාරිකය අලුතින් වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු පහකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය.

(උ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් හතලිස්හය දහසක (රු. 46,000) බැගින් වූ අටවන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර හයකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය.

6. 5 වන නියෝගයේ (ආ) සිට (උ) දක්වා වන ඡේදයන් හි නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රගතිය, එහි නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදයන්ට පෙරාතුව ළඟාකරගෙන ඇති බවට රබර් පාලකවරයා විසින් සෑහීමට පත්වන අවස්ථාවක දී, රබර් පාලකවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි අදාළ වාරිකය ඊට පෙර දිනයක දී නිදහස් කරනු ලැබිය හැකි ය.

7. 17 වන නියෝගයේ (අ) සහ (ආ) වන ඡේදවලට අනුකූලව මිස එම එළිපෙහෙළි කළ ඉඩමේ රබර් වගාකර වසර හතක් ඉක්මවීමෙන් පසු හෝ එම වගාවේ කිරි කැපීම ආරම්භ කිරීමෙන් පසු කිසිදු සහනාධාර වාරිකයක් ගෙවනු නොලැබිය යුතු ය.

8. වගා බිමෙහි ගස් සිටුවන ලද දිනය නැවත රබර් වගා කළ දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.

9. අලුතින් වගා කිරීමට නියමිත භූමි ප්‍රදේශය ප්‍රමාණයෙන් හෙක්ටයාරයකට වඩා අඩුවන අවස්ථාවක දී හෝ එම භූමි ප්‍රදේශයට හෙක්ටයාරයකට වඩා අඩු යම් බිම් කොටසක් ඇතුළත් වන විට දී, ගෙවිය යුතු සහනාධාර මුදල ගණනය කිරීමේ දී එම භූමි ප්‍රදේශය හෝ එකී බිම් කොටස හෙක්ටයාරයකට දරන්නා වූ අනුපාතයට අනුව එම භූමි ප්‍රදේශයට හෝ එම භූමි කොටස සඳහා මෙම නියෝගවල 5 වන නියෝගයේ නිශ්චිත සඳහන් කරන ලද මුදල් ප්‍රමාණ ගෙවනු ලැබිය යුතු ය.

10. අලුතින් වගා කළ යම් රබර් වත්තක හෝ කුඩා රබර් ඉඩම්වල පස්වන වසර අවසානයේදී හෙක්ටයාරයකට තිබිය යුතු ගස් ප්‍රමාණයෙන් අවම වශයෙන් 2/3 ක ගස් ප්‍රමාණයක්, පොළවේ සිට මැනීමේ දී සෙන්ටිමීටර් එකසිය විසි එකයි දශම නවයයි දෙකක් (121.92) ඉහළින් කඳෙහි පරිධිය සෙන්ටිමීටර් පනහයි දශම අටයි බින්දුවක (50.80) වට ප්‍රමාණයක් දරන බවට රබර් පාලකවරයා විසින් තත් කාර්ය සඳහා ලිඛිතව බලය දෙන ලද නිලධරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක් ලැබුණු පසුව, එම රබර් වතු හෝ කුඩා රබර්

ඉඩම්වල අලුතින් වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් දාහතර දහසක (රු. 14,000) මුදලකින් යුත් දිරිගැන්වීමේ දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

11. යම් ඉඩමක අලුතින් රබර් වගා කිරීම සඳහා අවසරපත්‍රයක් නිකුත් කර ඇති අවසරපත්‍රයක් දරන්නකු විසින්, සහනාධාර වාරික මුදල් ලබා ගැනීම සහ සහනාධාර වාරික මුදලින් ආපසු අයකර ගැනීම සඳහා යම් රාජ්‍ය බැංකු ශාඛාවක හෝ පෞද්ගලික වාණිජ බැංකු ශාඛාවක ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යා යුතු ය.

12. 19 වන නියෝගය යටතේ රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නිකුත් කරනු ලැබූ විධාන සහ නියමවලට අනුකූලව ක්‍රියා කිරීම සහ අලුතින් වගා කරන ලද භූමි ප්‍රදේශය හොඳ කෘෂිකාර්මික තත්ත්වයකින් පවත්වාගෙන යාම 5 වන නියෝගය යටතේ සහනාධාර වාරිකය ලද සෑම අවසරපත්‍ර දරන්නකුගේ ම කාර්යය විය යුත්තේ ය.

13. අලුතින් වගා කිරීමේ අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති භූමි ප්‍රදේශයක් සම්බන්ධයෙන් 5 වන නියෝගය යටතේ එක් සහනාධාර වාරිකයක් හෝ ඊට වැඩි වාරික ගණනක් ගෙවිය යුතුව ඇත්තේ යම් අවසරපත්‍ර දරන්නකු වෙත ද ඔහු විසින්, රබර් පාලකවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව එම භූමි ප්‍රදේශයෙන් කොටසක් හෝ සමස්ත භූමි ප්‍රදේශයම විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම නොකළ යුතු ය.

14. 5 වන නියෝගය යටතේ පළමුවන සහනාධාර වාරිකය ගෙවනු ලැබූ යම් අවසරපත්‍ර දරන්නකු විසින් රබර් පාලකවරයා විසින් දෙනු ලැබිය හැකි, එම වාරිකය ගෙවන ලද දින සිට අවුරුද්දක් ඇතුළත හෝ සවදුරටත් වූ කාලයක් ඇතුළත අලුතින් වගා කිරීමට නියමිත භූමි ප්‍රදේශයේ ඇති වෘක්ෂලතාදිය මුලින් උදුරා දමා එම භූමි ප්‍රදේශය එළිපෙහෙළි කොට -

(අ) රබර් පාලකවරයා විසින් අනුමත කරන ලද යම් වර්ගයකට හෝ වර්ගවලට අයත් රබර් පැළවලින් එම බිම් ප්‍රදේශය නැවත වගා කිරීම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය;

(ආ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් එසේ කරන ලෙස නියම කර ඇති විට දී රබර් පැළ සහ භූමි ආවරණ රනිල පැළ හැර අනෙකුත් සියලු පැළ එම භූමි ප්‍රදේශයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය;

(ඇ) ලිඛිත දැන්වීමක් මගින් රබර් පාලකවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි කාණු හෝ ගල් වැටි හෝ එම භූමි ප්‍රදේශයේ ඉදිකරනු ලැබිය යුතු ය;

(ඈ) එම භූමි ප්‍රදේශයේ භූමි ආවරණ රනිල පැළ සිටුවීම හෝ ලිඛිත දැන්වීමක් මගින් රබර් පාලකවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි එම භූමි ප්‍රදේශයේ පාංශු ඛාදනය වැළැක්වීම සඳහා අවශ්‍ය වෙනත් යම් පියවර ගැනීම සිදු කළ යුතු ය; සහ

(ඉ) ලිඛිත දැන්වීමක් මගින් රබර් පාලකවරයා විසින් එසේ කරන ලෙස ඉල්ලා ඇත්නම්, එම භූමි ප්‍රදේශය වටා වැටක් ඉදි කරනු ලැබිය යුතු ය.

15. (1) අවසරපත්‍ර දරන්නා විසින් 14 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද යම් කාර්යයක් සිදු කර නොමැති අවස්ථාවක දී, රබර් පාලකවරයා විසින්, එම කාර්යය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන පරිදි මිනිසුන් සේවයේ නියුක්ත කරවීම සහ අවශ්‍ය ද්‍රව්‍ය යෙදීම කරනු ලැබිය හැකිය.

(2) රබර් පාලකවරයා හෝ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා, ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම්, එම අවසරපත්‍ර දරන්නාට ගෙවිය යුතු සහනාධාරවලින් අඩු කරනු ලැබිය යුතු ය.

16. යම් භූමි ප්‍රමාණයක් සම්බන්ධයෙන් සහනාධාරයක් හෝ ඉන් කොටසක් ගෙවනු ලැබ ඇති යම් සෑම අවසරපත්‍ර දරන්නකු විසින්ම එම භූමි ප්‍රදේශයේ එක් එක් හෙක්ටයාරය තුළ නැවත වගා කරන ලද අවම රබර් පැළ සංඛ්‍යාව පහත දැක්වෙන නියමයන්ට අනුකූල වන බවට වගබලා ගත යුතු ය:-

(අ) (i) (මෙහි මින්මතු "ශ්‍රී.ල.ර.ප.ආ." යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ (ආර්.ආර්.අයි.සී./ආර්.ආර්.අයි.එස්.එල්.) රබර් ක්ලෝන වර්ගවලින් සහ රබර් පාලකවරයා විසින් අනුමත වෙනත් වැඩි ඵලදාවක් ලබාදෙන බද්ධ පැළ වගා කරනු ලබන අවස්ථාවක දී හෙක්ටයාරයකට පැළ 516 වන පරිදි;

(ii) වගා කිරීමෙන් පසුව පළමු සහ දෙවන වසර අවසානයේ දී හෙක්ටයාරයකට පැළ 516 ක් වන පරිදි,

(iii) වගා කිරීමෙන් පසු තුන්වන සහ හතර වන වසර අවසානයේ දී හෙක්ටයාරයකට පැළ 475 ක් වන පරිදි,

(iv) වගා කිරීමෙන් පසු ඊළඟට එළඹෙන අනුගාමී වසර දෙක සඳහා හෙක්ටයාරයකට පැළ 450 ක් වන පරිදි,

(v) 17 වන නියෝගයේ (ආ) ඡේදයට අදාළව, නැවත වගා කිරීමෙන් පසු ඊළඟට එළඹෙන අනුගාමී වසර තුන සඳහා හෙක්ටයාරයකට පැළ 450 ක් වන පරිදි.

(ආ) බද්ධ කරන ලද රබර් පැළ පහත නිශ්චිතව සඳහන් දුර ප්‍රමාණයන්ගෙන් සහ පහත දක්වා ඇති පැළ සංඛ්‍යාවෙන් සිටුවනු ලැබිය යුතු ය:-

(i) ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ, (ශ්‍රී.ල.ර.ප.ආ) ක්ලෝන සහ අනෙකුත් වැඩි එලදාව සහිත ක්ලෝන සඳහා-

| පැළ අතර පරතරය | පැළ සංඛ්‍යාව |
|---|---|
| සෙ.මී 350 x සෙ.මී. 550<br>(11' 6" x 18') | හෙක්ටයාරයකට 516<br>(අක්කරයකට 209) |
| සෙ.මී 430 x සෙ.මී. 450<br>(14' x 14'9") | හෙක්ටයාරයකට 516<br>(අක්කරයකට 209) |

(ii) ආර්.ආර්.අයි.එස්.එල්.ආර්.අයි.සී. ක්ලෝන සමඟ අතුරු භෝග වගා කිරීම සඳහා-

| පැළ අතර පරතරය | පැළ සංඛ්‍යාව |
|---|---|
| සෙ.මී 250 x සෙ.මී.775<br>(8' x 26') | හෙක්ටයාරයකට 516<br>(අක්කරයකට 209) |

(ඇ) ඉහත සඳහන් දුර ප්‍රමාණයන් හැර වෙනත් පැළ සිටුවන දුර ප්‍රමාණයන් හි පැළ සිටුවීම සඳහා රබර් පාලකවරයා විසින් භූමියේ පිහිටීම සලකා බලා අවසර දෙනු ලැබිය හැකි ය:

එසේ වුව ද, පැළ සංඛ්‍යාව (ආ) ඡේදයේ (i) වන සහ (ii) වන අනුඡේදවල සඳහන් කර ඇති සංඛ්‍යාවට නොඅඩු විය යුතු ය.

17. යම් භූමි ප්‍රමාණයක වගා කරන ලද රබර් පැළ පොළවට ඉහළින් සෙන්ටිමීටර් 121.92ක උසකදී රබර් පැළයේ අවම වට ප්‍රමාණය පහත පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නා වූ පියවර ගැනීම, එම භූමි ප්‍රමාණය සම්බන්ධයෙන් සහතිකධාරියක් හෝ එයින් යම් කොටසක් ගෙවන ලද හැම අවසරපත්‍ර දරන්නකුගේ ම කාර්යය වන්නේය.

(අ) සෙන්ටිමීටර 254ක හෝ ඊට වැඩි සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් සහිත දිස්ත්‍රික්කයක එම බිම් ප්‍රදේශය පිහිටා ඇති අවස්ථාවක දී පහත I වන වගුවේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය :-

I වන වගුව

| වගාවේ වයස | නියමිත වට ප්‍රමාණය (සෙන්ටිමීටර්) |
|---|---|
| අලුතින් වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වසර අවසානයේ දී | 10.16 |
| අලුතින් වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වසර අවසානයේ දී | 15.87 |
| අලුතින් වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වසර අවසානයේ දී | 25.40 |
| අලුතින් වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වසර අවසානයේ දී | 31.75 |
| අලුතින් වගා කිරීමෙන් පසු එළඹෙන හත්වන වර්ෂයේ අවසානයට වඩා පසු නොවන විටදී | 50.80 |

(ආ) සෙන්ටිමීටර 254කට වඩා අඩු සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් සහිත දිස්ත්‍රික්කයක එම භූමි ප්‍රදේශය පිහිටා ඇති අවස්ථාවක දී පහත II වන වන වගුවේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය :-

**II වන වගුව**

| වගාවේ වයස | සෑදෙහි වට ප්‍රමාණය (සෙන්ටිමීටර) |
|---|---|
| අලුතින් වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වසර අවසානයේ දී | 10.16 |
| අලුතින් වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වසර අවසානයේ දී | 13.97 |
| අලුතින් වගා කිරීමෙන් පසු එළඹෙන හතර වන වසර අවසානයේ දී | 22.86 |
| අලුතින් වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වසර අවසානයේ දී | 27.94 |
| අලුතින් වගා කිරීමෙන් පසු එළඹෙන අටවන වර්ෂයේ අවසානයට වඩා පසුනොවන විටදී | 50.80 |

18. යම් භූමි ප්‍රදේශයක් සම්බන්ධයෙන් සම්පූර්ණ සහනාධාරයක් හෝ එයින් යම් කොටසක් හෝ ලැබූ කිසිදු අවසරපත්‍ර දරන්නකු රබර් පැළවලින් සියයට හැටක (60%) වත් පැළ ප්‍රමාණයක පොළවේ සිට මනින විට දී උස සෙන්ටිමීටර එකසිය විසි එකයි දශම නවයයි දෙකේ දී (121.92) සෑදෙහි අවම වට ප්‍රමාණය සෙන්ටි මීටර පනහයි දශම අටයි බින්දුව (50.80) වන තුරු රබර් ගස්වල කිරි කැපීම හෝ කිරි කැපීමට සැළැස්වීම නොකළ යුතු ය.

19. 5 වැනි නියෝගය යටතේ යම් අවසරපත්‍ර දරන්නකු වෙත සහනාධාරයක් ගෙවීමට ඇති හෝ ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී, රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නිශ්චිතව දක්වා ඇති යම් කාල පරිච්ඡේදයක් ඇතුළත, රබර් වත්තක හෝ කුඩා රබර් ඉඩමක අලුතින් රබර් වගා කිරීමේ කාර්යය සතුටුදායක ආකාරයෙන් සිදුකරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි යයි රබර් පාලකවරයා විසින් සලකනු ලබන යම් විධාන හා නියමයන්ට අවසරපත්‍ර දරන්නා විසින් අනුකූල විය යුතු ය.

20. යම් සහනාධාරයක් හෝ සහනාධාරයකින් යම් ප්‍රමාණයක් ගෙවනු ලැබ ඇති යම් අවසරපත්‍ර දරන්නකු විසින් 12 වන, 13 වන, 14 වන, 15 වන, 16 වන, 17 වන හෝ 18 වන නියෝග කඩකර ඇති බව රබර් පාලකවරයාගේ මතය වන අවස්ථාවක දී, යම් භූමි ප්‍රදේශයක් සම්බන්ධයෙන් අවසරපත්‍ර දරන්නා වෙත ගෙවනු ලැබූ සහනාධාර මුදල වහාම හෝ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලය ඇතුළත නැවත ගෙවීමට රබර් පාලකවරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින් ඔහුට නියම කරනු ලැබිය හැකි අතර මේ නියෝගය යටතේ දැන්වීම ඉදිරිපත් කරනු ලැබුවේ යම් අවසරපත්‍ර දරන්නකු වෙත ද එම තැනැත්තා විසින් එම දැන්වීමට අනුකූල වීමට අපොහොසත් නොවිය යුතු ය.

21. (1) රබර් පාලකවරයා විසින් කාර්ය පටිපාටියක් යටතේ යම් තැනැත්තෙකු වෙත සහනාධාරයක් හෝ වෙනත් ප්‍රදානයක් ලෙස ගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක් ආපසු ගෙවා නොමැති විටදී එම මුදල් ප්‍රමාණය අධිකරණයක් විසින් පනවන ලද දඩයක් ලෙස ආපසු අයකර ගත යුතු ය.

(2) සහනාධාර වාරික එකක් හෝ ඊට වැඩි ගණනක් ලබාගෙන ඇති යම් තැනැත්තකු විසින්, එම සහනාධාරය ආපසු ගෙවීමට අපොහොසත් වී ඇති බවට සහ රබර් වත්තක් අත්හැර දමූ බවට රබර් පාලකවරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කිරීම, ඒ කරුණ පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් ලෙස සලකනු ලැබිය යුතු ය.

22. කලින් කලට සංශෝධිත පරිදි, 1977 මාර්තු මස 23 වන දිනැති අංක 258 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර නියෝගවල විධිවිධානයන්හි කුමක් සඳහන් වුව ද, පිළිවෙලින් 2013, 2014, 2015, 2016, 2017, 2018 සහ 2019 වර්ෂයන්ට අදාළව නිකුත් කරන ලද රබර් අලුතින් වගා කිරීමේ යම් අවසර පත්‍රයක් වෙනුවෙන් ගෙවිය යුතු පහත සඳහන් සහනාධාර වාරික සහ එම අවසරපත්‍ර වෙනුවෙන් ගෙවිය යුතු සියලුම වාරික මේ නියෝග ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ගෙවා නොමැති අවස්ථාවක දී, එම වාරික, 5 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද අනුප්‍රමාණ අනුව පහත දක්වා ඇති පරිදි ගෙවනු ලැබිය යුතු ය :-

| | |
|---|---|
| 2013 වර්ෂය | - 5 (ඌ) නියෝගයට අනුකූලව අටවන වාරිකය ; |
| 2014 වර්ෂය | - 5 (උ) නියෝගයට අනුකූලව හත්වන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2015 වර්ෂය | - 5 (ඊ) නියෝගයට අනුකූලව හයවන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2016 වර්ෂය | - 5 (ඉ) නියෝගයට අනුකූලව පස්වන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2017 වර්ෂය | - 5 (ඈ) නියෝගයට අනුකූලව හතරවන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2018 වර්ෂය | - 5 (ඇ) නියෝගයට අනුකූලව තුන්වන වාරිකයේ සිට ඉදිරියට ; |

2019 වර්ෂය - 5 (අ) සහ 5 (ආ) නියෝගවලට අනුකූලව පළමුවන සහ දෙවන වාරිකවල සිට ඉදිරියට ;

23. මේ නියෝගවල -

"හිමිකරු" යන්නට, (436 වන අධිකාරය වූ) රබර් පාලන පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"වත්ත" යන්නට, (436 වන අධිකාරය වූ) රබර් පාලන පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"අලුතින් වගා කිරීමේ අවසර පත්‍රය" යන්නෙන්, (436 වන අධිකාරය වූ) රබර් පාලන පනතේ 7 (1) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අදහස් වේ ;

"කුඩා ඉඩම්" යන්නට (436 වන අධිකාරය වූ) රබර් පාලන පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"රබර් පාලකවරයා" යන්නට, (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

09 - 40/2

---

එල්.ඩී.බී. 51/53 (III)

## (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත

(437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රමේෂ් පතිරණ,
වැවිලි අමාත්‍ය.

2021 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2021 අංක 03 දරන රබර් නැවත වගා කිරීමේ (වැවිලි සමාගම්) සහනාධාර නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙම නියෝග 2019 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

2. (436 වන අධිකාරය වූ) රබර් පාලන පනතේ 7 වන වගන්තිය යටතේ අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති (මෙහි මින්මතු "අවසරපත්‍ර දරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් රබර් වත්තක හිමිකරු විසින්, එම වත්තේ රබර් පැළ නැවත වගා කිරීමේ කාර්යය සඳහා සහනාධාර ලබාගැනීමට රබර් පාලකවරයා වෙත ලිඛිතව ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

3. 2 වන නියෝගය යටතේ සහනාධාරයක් සඳහා වන සෑම ඉල්ලීමක් ම, රබර් පාලකවරයා විසින් නිර්ණය කරනු ලැබිය හැකි ආකෘතියට අනුකූලව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

4. එසේ ඉල්ලීමක් ලැබීමෙන් පසුව, රබර් පාලකවරයා විසින් මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලෙන් එම ඉල්ලුම්කරු වෙත සහනාධාරයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

5. 2019 වර්ෂයේ සහ ඉන්පසුව එළඹෙන වර්ෂයන් සම්බන්ධයෙන්, රබර් පාලකවරයා විසින් නිකුත් කරන ලද නැවත වගාකිරීමේ අවසරපත්‍රය මත අනන්‍ය පෞද්ගලික හිමිකාරීත්වයක් ඇති රබර් වත්තක යම් නිශ්චිත කොටසක රබර් නැවත වගාකිරීම සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල නැවත වගා කිරීම සඳහා වන එක් එක් හෙක්ටයාරයක භූමි ප්‍රමාණයක් සඳහා රුපියල් තුන් ලක්ෂ පනස් දහසක් (රු. 350,000) විය යුතු අතර එය පහත දැක්වෙන ආකාරයට අනුව වාරික අටකින් ගෙවනු ලැබිය යුතු ය:-

(අ) (i) එම භූමි ප්‍රදේශයේ ඇති රබර් ගස් සහ අනෙකුත් වෘක්ෂලතා මුලින් උදුරා දැමීමෙන් පසුව නැවත වගාකළ යුතු භූමි ප්‍රදේශයේ එක් එක් හෙක්ටයාරයක් සඳහා රුපියල් දහසය දහසක් (රු. 16,000) බැගින් වූ පළමු වන වාරිකය, ගෙවනු ලැබිය යුතු ය ;

(ii) එම ඉඩමේ තිබෙන රබර් ගස් හා අනෙකුත් වෘක්ෂලතාදිය මුලින් උදුරා දැමීම සම්පූර්ණ කළ බවට දැනුම් දීමෙන් පසුව රබර් පාලකවරයා විසින් පළමු වන වාරිකයෙන් සියයට පනහක් (50%) නොඉක්මවන මුදල් ප්‍රමාණයක් අවසර පත්‍රය දරන්නා වෙත කොටස් ගෙවීමක් ලෙස ගෙවනු ලැබිය හැකි ය ;

(ආ) (i) එක් එක් හෙක්ටයාරයකට රුපියල් අසූහය දහස (රු. 86,000) බැගින් වූ දෙවන වාරිකය රබර් ගස් නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව ගෙවනු ලැබිය යුතු ය;

(ii) නැවත වගා කිරීම සම්පූර්ණ කළ බවට දැනුම් දීමෙන් පසුව, රබර් පාලකවරයා විසින්, දෙවන වාරිකයෙන් සියයට පනහක් (50%) නොඉක්මවන මුදල් ප්‍රමාණයක් අවසර පත්‍රය දරන්නා වෙත ගෙවනු ලැබිය හැකි ය.

(iii) දෙවන වාරිකය ගෙවීම සඳහා අවශ්‍ය සියලු කටයුතු සම්පූර්ණ කර නොමැති බව පරීක්ෂණයේ දී පෙනී ගිය විට දී, පහත සඳහන් කටයුතු සතුටුදායක අන්දමින් සම්පූර්ණ කිරීමෙන් පසුව පහත සඳහන් ආකාරයෙන් එම ගෙවීම කරනු ලැබිය යුතු ය:-

| සම්පූර්ණ කළ යුතු කටයුතු | හෙක්ටයාරයක් සඳහා වන සහනාධාරය රු. ශත |
|---|---|
| 1. වලවල් කැපීම සහ බද්ද රබර් පැළ සිටුවීම | 50,000.00 |
| 2. පාංශු සංරක්ෂණය (කාණු කැපීම හෝ ගල් වැටි, වේදිකා ඉදිකිරීම හෝ ආවරණ භෝග වගා කිරීම යනාදිය) | 20,000.00 |
| 3. වැට බැඳීම | 16,000.00 |

(iv) ගෙවීමට ඇති යම් ඉතිරි මුදල් ප්‍රමාණයක් වේ නම්, සම්පූර්ණ නොකළ කටයුතු සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් ගෙවනු ලැබිය යුතු ය.

(v) සිදු කිරීමට අවශ්‍ය කටයුතුත් සම්පූර්ණ කරන තෙක් පසු වාරික ගෙවීම අත්හිටුවනු ලැබිය යුතු ය:-

(ඇ) එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් තිස් දහසක (රු. 30,000) තුන් වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසරකට නොඅඩු කාලයක් ඉක්මවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය.

(ඈ) එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් හතළිස් දෙදහසක (රු. 42,000) සිව්වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර දෙකක් ඉක්මවීමෙන් පසුව ගෙවනු ලැබිය යුතු ය;

(ඉ) එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් හතළිස් දෙදහසක (රු. 42,000) පස්වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර තුනක් ඉක්ම වීමෙන් පසුව ගෙවනු ලැබිය යුතු ය;

(ඊ) එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් හතළිස් දෙදහසක (රු. 42,000) හයවන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර හතරක් ඉක්මවීමෙන් පසුව ගෙවනු ලැබිය යුතු ය;

(උ) එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් හතළිස් හතර දහසක (රු. 44,000) හත්වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර පහක් ඉක්මවීමෙන් පසුව ගෙවනු ලැබිය යුතු ය;

(ඌ) එක් එක් හෙක්ටයාරය සඳහා වන රුපියල් හතළිස් අට දහසක (රු. 48,000) අටවන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර හයක් ඉක්මවීමෙන් පසුව ගෙවනු ලැබිය යුතු ය;

6. 5 වන නියෝගයේ (ඇ) සිට (ඌ) දක්වා වන ඡේදවල නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රගතිය, එහි නිශ්චිතව සඳහන් කරන ලද කාල සීමාවන්ට පෙරාතුව ළඟාකරගෙන ඇති බවට රබර් පාලකවරයා සෑහීමට පත්වන අවස්ථාවක දී, රබර් පාලකවරයා විසින් ස්වකීය අභිමතය පරිදි අදාළ වාරිකය නියමිත කාලයට පෙර දිනයක දී නිදහස් කරනු ලැබිය හැකි ය.

7. 17 වන නියෝගයේ (අ) සහ (ආ) වන ඡේදවලට අනුකූලව මිස නැවත වගා කිරීම සම්පූර්ණ කර වසර හයක් ඉක්මවීමෙන් පසු හෝ අදාළ වගාවේ කිරි කැපීම ආරම්භ කිරීමෙන් පසු කිසිදු සහනාධාර වාරිකයක් ගෙවනු නොලැබිය යුතු ය.

8. වගා බිමෙහි ගස් සිටුවන ලද දිනය නැවත වගා කළ දිනය ලෙස සැළකිය යුතු ය.

9. නැවත වගා කළ යුතු භූමි ප්‍රදේශය ප්‍රමාණයෙන් හෙක්ටයාරයකට වඩා අඩුවන විට දී හෝ එම භූමි ප්‍රදේශයට හෙක්ටයාරයකට වඩා අඩු කොටසක් ඇතුළත් වන විට දී, ගෙවිය යුතු සහනාධාර මුදල් ප්‍රමාණය ගණනය කිරීමේ දී, එම භූමි ප්‍රමාණය හෝ භූමි කොටස හෙක්ටයාරයකට දරන්නා වූ අනුපාතයට අනුව එම භූමි ප්‍රමාණය හෝ එම භූමි කොටස සඳහා, මේ නියෝගවල 5 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද මුදල් ප්‍රමාණ ගෙවනු ලැබිය යුතු ය.

10. රබර් වත්තක හිමිකරුවකුට, නැවත වගා කිරීමෙන් පස්වන වසර අවසානයේදී හෙක්ටයාරයකට තිබිය යුතු ගස් ප්‍රමාණයෙන් අවම වශයෙන් 2/3 ක ගස් ප්‍රමාණයක්, පොළවේ සිට මැනීමේ දී සෙන්ටිමීටර් එකසිය විසි එකයි දශම නවයයි දෙකක් (121.92) ඉහළින් කඳෙහි පරිධිය සෙන්ටිමීටර් පනහයි දශම අටයි බින්දුවක (50.80) වට ප්‍රමාණයක් දරන බවට රබර් පාලකවරයා විසින් ඒ කාර්ය සඳහා ලියවිල්ලක් මගින් බලය දෙන ලද නිලධරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක් ලැබුණු පසුව, එම රබර් වත්ත නැවත වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් දාහතර දහසක (රු.14,000) මුදලකින් යුත් දිරිගැන්වීමේ දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

11. යම් ඉඩමක රබර් නැවත වගා කිරීම සඳහා අවසරපත්‍රයක් නිකුත් කර ඇත්තේ යම් අවසරපත්‍ර දරන්නකු වෙත ද, එවැනි යම් රබර් වත්තක අවසරපත්‍ර දරන්නකු විසින් සහනාධාර වාරික ගෙවීම බලාත්මක කිරීම සහ සහනාධාර වාරික ගෙවීම ආපසු අයකර ගැනීම බලාත්මක කිරීම යන කාර්යයන් සඳහා යම් රාජ්‍ය බැංකුවක ශාඛාවක හෝ පෞද්ගලික වාණිජ බැංකුවක ශාඛාවක ජංගම ගිණුමක් ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

12. 19 වන නියෝගය යටතේ රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නිකුත් කරනු ලබන විධාන සහ නියමවලට අනුකූලව කටයුතු කිරීම සහ නැවත වගා කරන ලද භූමි ප්‍රදේශය හොඳ කෘෂිකාර්මික තත්ත්වයකින් පවත්වාගෙන යාම 15 වන නියෝගය යටතේ සහනාධාරයේ පළමුවන වාරිකය ගෙවනු ලැබ ඇති සෑම අවසරපත්‍රයක් දරන්නකුගේ ම කාර්යය විය යුතුය.

13. නැවත වගා කිරීමේ අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් ප්‍රදේශයක් සඳහා ද එම භූමි ප්‍රදේශය සම්බන්ධයෙන් 5 වන නියෝගය යටතේ එක් සහනාධාර වාරිකයක් හෝ ඊට වැඩි සහනාධාර වාරික සංඛ්‍යාවක් ගෙවීමට ඉතිරිව ඇත්තේ යම් අවසරපත්‍ර දරන්නකුට ද එම අවසර පත්‍ර දරන්නා විසින්, රබර් පාලකවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව එම මුළු භූමි ප්‍රදේශයම හෝ එම භූමි ප්‍රදේශයෙන් කොටසක් විකිණීම හෝ අන්සතුකාරයකින් බැහැර කිරීම සිදු නොකළ යුතු ය.

14. 5 වන නියෝගය යටතේ පළමු සහනාධාර වාරිකය ගෙවනු ලැබූ යම් රබර් ගස් නැවත වගා කිරීමේ අවසරපත්‍ර දරන්නකු රබර් පාලකවරයා විසින් දෙනු ලැබිය හැකි, එම වාරිකය ගෙවූ දින සිට අවුරුද්දක් ඇතුළත හෝ ඒ සම්බන්ධයෙන් තවදුරටත් වූ කාලයක් ඇතුළත -

(අ) රබර් පාලකවරයා විසින් අනුමත කරන ලද යම් වර්ගයකට හෝ වර්ගවලට අයත් රබර් පැළවලින් එම භූමි ප්‍රදේශය නැවත වගා කිරීම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය;

(ආ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් එසේ කරන ලෙස නියම කර ඇති විට දී රබර් පැළ සහ භූමි ආවරණ රනිල පැළ හැර අනෙකුත් සියලු පැළ එම භූමි ප්‍රදේශයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය;

(ඇ) ලිඛිත දැන්වීමක් මගින් රබර් පාලකවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි කානු හෝ ගල් වැටි එම භූමි ප්‍රදේශයේ ඉදිකරනු ලැබිය යුතු ය;

(ඈ) එම භූමි ප්‍රදේශයේ බිම් ආවරණ රනිල පැළ සිටුවීම හෝ ලිඛිත දැන්වීමක් මගින් රබර් පාලකවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි එම භූමි ප්‍රදේශයේ පාංශු ඛාදනය වැළැක්වීම සඳහා අවශ්‍ය වෙනත් යම් පියවර ගැනීම සිදු කළ යුතු ය; සහ

(ඉ) ලිඛිත දැන්වීමක් මගින් රබර් පාලකවරයා විසින් එසේ කරන ලෙස ඉල්ලා ඇත්නම්, එම භූමි ප්‍රදේශය වටා වැටක් ඉදිකරනු ලැබිය යුතු ය.

15. (1) අවසරපත්‍ර දරන්නා විසින් 14 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද යම් කාර්යයක් සිදු කර නොමැති අවස්ථාවක දී, රබර් පාලකවරයා විසින්, එම කාර්යය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන පරිදි මිනිසුන් සේවයේ නියුක්ත කරවීම සහ අවශ්‍ය ද්‍රව්‍ය යෙදීම කරනු ලැබිය හැකිය.

(2) රබර් පාලකවරයා විසින්, ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම්, එම අවසරපත්‍රය දරන්නාට ගෙවිය යුතු සහනාධාරවලින් අඩු කරනු ලැබිය යුතු ය.

16. යම් බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් සහනාධාරයක් හෝ ඉන් කොටසක් ගෙවනු ලැබ ඇති සෑම අවසරපත්‍ර දරන්නකු විසින්ම එම භූමි ප්‍රදේශයේ එක් එක් හෙක්ටයාරය තුළ නැවත වගා කරන ලද අවම රබර් පැළ සංඛ්‍යාව පහත දැක්වෙන නියමයන්ට අනුකූල වන බවට වගබලා ගනු ලැබිය යුතු ය:-

(අ) (i) වගා කර ඇත්තේ (මෙහි මින්මතු "ශ්‍රී.ල.ර.ප.ආ." යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ රබර් ක්ලෝන ("ආර්.ආර්.අයි.සී, ආර්.ආර්.අයි.එස්.එල්.") සහ රබර් පාලකවරයා විසින් අනුමත කරන ලද වෙනත් වැඩි ඵලදාවක් ලබාදෙන බද්ධ රබර් පැළ නම්, නැවත වගා කරන අවස්ථාවේ දී හෙක්ටයාරයකට පැළ 516ක් වන පරිදි; සහ

(ii) නැවත වගා කිරීමෙන් පසුව පළමු වන වසර සහ දෙවන වසර අවසානයේ දී හෙක්ටයාරයකට පැළ 516 ක් වන පරිදි;

(iii) නැවත වගා කිරීමෙන් පසු තුන්වන සහ හතර වන වසර අවසානයේ දී හෙක්ටයාරයකට පැළ 475 ක් වන පරිදි;

(iv) නැවත වගා කිරීමෙන් පසු ඊළඟ අනුගාමී වසර දෙක සඳහා හෙක්ටයාරයකට පැළ 450 ක් වන පරිදි;

(v) 17 වන නියෝගයේ (ආ) වන ඡේදයට අනුව, නැවත වගා කිරීමෙන් පසු ඊළඟ අනුගාමී වසර තුන සඳහා හෙක්ටයාරයකට පැළ 450 ක් වන පරිදි.

(ආ) බද්ධ කරන ලද රබර් පැළ පහත පරිදි වන දුර ප්‍රමාණයන්ගෙන් සහ නිශ්චිතව දක්වා ඇති පැළ සංඛ්‍යාවකින් යුතුව සිටුවනු ලැබිය යුතු ය:-

(i) ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ (ආර්.ආර්.අයි.සී, ආර්.ආර්.අයි.එස්.එල්.) ක්ලෝන සහ අනෙකුත් වැඩි ඵලදාව සහිත ක්ලෝන සඳහා-

| පැළ අතර පරතරය | පැළ සංඛ්‍යාව |
|---|---|
| සෙ.මී 350 x සෙ.මී. 550<br>(11' 6" x 18') | හෙක්ටයාරයකට 516<br>(අක්කරයකට 209) |
| සෙ.මී 430 x සෙ.මී. 450<br>(14' x 14'9") | හෙක්ටයාරයකට 516<br>(අක්කරයකට 209) |

(ii) (ආර්.ආර්.අයි.සී, ආර්.ආර්.අයි.එස්.එල්.) ක්ලෝන සහ අනෙකුත් වැඩි ඵලදාව සහිත ක්ලෝන සමග අතුරු භෝග වගා කිරීම සඳහා-

| පැළ අතර පරතරය | පැළ සංඛ්‍යාව |
|---|---|
| සෙ.මී 250 x සෙ.මී.775<br>(8' x 26') | හෙක්ටයාරයකට 516<br>(අක්කරයකට 209) |

(ඇ) ඉහත සඳහන් දුර ප්‍රමාණයන් හැර වෙනත් පැළ සිටුවන දුර ප්‍රමාණයන් හි පැළ සිටුවීම සඳහා රබර් පාලකවරයා විසින් භූමියේ පිහිටීම සලකා බලා අවසර ලබා දිය හැකි ය.

එසේ වුව ද, පැළ අතර අවම දුර ප්‍රමාණය (ආ) වන ඡේදයේ (i) වන සහ (ii) වන අනුඡේදවල සඳහන් කර ඇති සංඛ්‍යාවට අනුකූලවිය යුතු ය.

17. යම් භූමි ප්‍රමාණයක නැවත වගා කරන ලද රබර් පැළ පොළවට ඉහළින් සෙන්ටිමීටර් 121.92ක උසකදී රබර් පැළයේ අවම වට ප්‍රමාණය පහත පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නා වූ පියවර ගැනීම එම භූමි ප්‍රමාණය සම්බන්ධයෙන් සහනාධාරයක් හෝ එයින් යම් කොටසක් ගෙවන ලද සෑම අවසරපත්‍ර දරන්නකුගේ ම කාර්යය වන්නේ ය.

(අ) සෙන්ටිමීටර 254ක සහ ඊට වැඩි සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් සහිත දිස්ත්‍රික්කයක එම භූමි ප්‍රදේශය පිහිටා ඇති අවස්ථාවක දී පහත I වන වගුවේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය :-

I වන වගුව

| වගාවේ වයස | සඳහන් වට ප්‍රමාණය (සෙන්ටිමීටර) |
|---|---|
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේ දී | 10.16 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේ දී | 15.87 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වර්ෂය අවසානයේ දී | 25.40 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේ දී | 31.75 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හත්වන වර්ෂයේ අවසානයට වඩා පසු නොවන විට දී | 50.80 |

(ආ) සෙන්ටිමීටර 254කට වඩා අඩු සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් සහිත දිස්ත්‍රික්කයක එම භූමි ප්‍රදේශය පිහිටා ඇති අවස්ථාවක දී පහත II වන වන වගුවේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය :-

II වන වගුව

| වගාවේ වයස | සඳහන් වට ප්‍රමාණය (සෙන්ටිමීටර) |
|---|---|
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේ දී | 10.16 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේ දී | 13.97 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හතර වන වර්ෂය අවසානයේ දී | 22.86 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේ දී | 27.94 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන අටවන වර්ෂයේ අවසානයට වඩා පසු නොවන විට දී | 50.80 |

18. යම් භූමි ප්‍රමාණයක් සම්බන්ධයෙන් සම්පූර්ණ සහනාධාරයක් හෝ එයින් යම් කොටසක් හෝ ලැබූ කිසිදු අවසරපත්‍ර දරන්නකු විසින්, රබර් පැළවලින් සියයට හැටක් (60%) වත් වන පැළ ප්‍රමාණයක පොළවේ සිට මනින විට දී උස සෙන්ටිමීටර එකසිය විසි එකයි දශම නවයයි දෙකක් ද (121.92) සඳහන් අවම වට ප්‍රමාණය සෙන්ටි මීටර් පනහයි දශම අටයි බින්දුව (50.80) වන තුරු රබර් ගස්වල කිරි කැපීම හෝ කිරි කැපීමට සැළැස්වීම නොකළ යුතු ය.

19. 5 වැනි නියෝගය යටතේ යම් අවසරපත්‍ර දරන්නකු වෙත සහනාධාරයක් ගෙවීමට ඇති හෝ ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී, රබර් පාලකවරයා විසින් දැන්වීමක් මගින් ලිඛිතව නිශ්චිතව දක්වා ඇති යම් කාල පරිච්ඡේදයක් ඇතුළත, රබර් වත්තක නැවත වගා කිරීම සතුටුදායක ආකාරයෙන් සිදුකරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි යයි රබර් පාලකවරයා සලකනු ලබන යම් විධාන හා නියමයන්ට එකී අවසරපත්‍ර දරන්නා අනුකූල විය යුතු ය.

20. යම් සහනාධාරයක් හෝ සහනාධාරයකින් යම් ප්‍රමාණයක් ගෙවනු ලැබ ඇති යම් අවසරපත්‍ර දරන්නකු විසින් 12 වන, 13 වන, 14 වන, 15 වන, 16 වන, 17 වන හෝ 18 වන නියෝගවල විධිවිධාන කඩකර ඇති බව රබර් පාලකවරයාගේ මතය වන අවස්ථාවක දී රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් යම් භූමි ප්‍රදේශයක් සම්බන්ධයෙන් අවසරපත්‍රය දරන්නා වෙත ගෙවනු ලැබූ සහනාධාර මුදල් වහාම හෝ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලය ඇතුළත නැවත ගෙවීමට අවසර පත්‍රය දරන්නා වෙත නියම කරනු ලැබිය හැකි අතර එම නියෝගය යටතේ දැන්වීම ඉදිරිපත් කරනු ලැබුවේ යම් අවසරපත්‍රය දරන්නකු වෙත ද එම තැනැත්තා විසින් එම දැන්වීමට අනුකූල වීමට අපොහොසත් නොවිය යුතු ය.

21. (1) රබර් පාලකවරයා විසින් කාර්ය පටිපාටියක් යටතේ යම් තැනැත්තකු වෙත සහනාධාරයක් හෝ වෙනත් ප්‍රදානයක් ලෙස ගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක් ආපසු ගෙවා නොමැති විට දී, එම මුදල් ප්‍රමාණය අධිකරණයක් විසින් පනවන ලද දඩයක් ලෙස ආපසු අයකර ගත යුතු ය.

(2) සහනාධාර වාරික එකක් හෝ ඊට වැඩි ගණනක් ලබාගෙන ඇති යම් තැනැත්තකු විසින්, එම සහනාධාරය ආපසු ගෙවීමට අපොහොසත් වී ඇති බවට සහ රබර් වත්තක් අත්හැර දමූ බවට රබර් පාලකවරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කිරීම, ඒ කරුණ පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් ලෙස සලකනු ලැබිය යුතු ය.

22. කලින් කලට සංශෝධිත පරිදි, 1953 ඔක්තෝබර් මස 13 වන දිනැති අංක 10594 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර නියෝගවල විධිවිධානයන්හි කුමක් සඳහන් වුව ද, පිළිවෙලින් 2013, 2014, 2015, 2016, 2017, 2018 සහ 2019 වර්ෂවලදී නිකුත් කරන ලද රබර් නැවත වගා කිරීමේ යම් අවසර පත්‍රයක් වෙනුවෙන් ගෙවිය යුතු පහත සඳහන් සහනාධාර වාරික සහ එම අවසරපත්‍ර වෙනුවෙන් ගෙවිය යුතු සියලුම වාරික මේ නියෝග ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ගෙවා නොමැති අවස්ථාවක දී, එම වාරික, 5 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද අනුප්‍රමාණ අනුව පහත දක්වා ඇති පරිදි ගෙවනු ලැබිය යුතු ය :-

| | |
|---|---|
| 2013 වර්ෂය | - 5 (ඌ) නියෝගයට අනුකූලව අටවන වාරිකය ; |
| 2014 වර්ෂය | - 5 (උ) නියෝගයට අනුකූලව හත්වන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2015 වර්ෂය | - 5 (ඊ) නියෝගයට අනුකූලව හයවන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2016 වර්ෂය | - 5 (ඉ) නියෝගයට අනුකූලව පස්වන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2017 වර්ෂය | - 5 (ඈ) නියෝගයට අනුකූලව හතරවන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2018 වර්ෂය | - 5 (ඇ) නියෝගයට අනුකූලව තුන්වන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2019 වර්ෂය | - 5 (අ) සහ 5 (ආ) නියෝගවලට අනුකූලව පළමුවන සහ දෙවන වාරිකවල සිට ඉදිරියට ; |

23. මේ නියෝගවල :-

"හිමිකරු" යන්නට, (436 වන අධිකාර වූ) රබර් පාලන පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"වත්ත" යන්නට, (436 වන අධිකාරය වූ) රබර් පාලන පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"නැවත වගා කිරීමේ අවසර පත්‍රය" යන්නෙන්, රබර් පාලන පනතේ 7 (1) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අදහස් වේ ;

"රබර් පාලකවරයා" යන්නට, (436 වන අධිකාරය වූ) රබර් පාලන පනත යටතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

09 - 40/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.